කෙනෙකුට නැරඹීමට අපහසු තරමේ ලේ වැකි, සංවේදී ඡායාරූප හෝ දර්ශන මාධ්‍ය ඔස්සේ පළ කිරීමේ ගැටළුව වන්නේ, එවැනි අන්තර්ගතයන් ඇතැම් පුද්ගලයින් හට නැරඹීමට නොහැකි වීමත්, එවැනි අන්තර්ගතයන් ඒ ඔස්සේ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය වීමට ඇති හැකියාවත් වේ.

ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට මාධ්‍ය ප්‍රවේසම් සහගත විය යුතු බවට මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් ද උපදෙස් දේ.

"හූනියම් සැකයකට යකැදුරුගේ බෙල්ල කපලා නිල්වලා ගඟට දාපු යක්ෂ කතාවක්" යන සිරස්තලයෙන් මව්බිම පුවත්පතේ (ජූලි 03, 2022) පළ වූ ලිපියත්, "රුපියල් දහස උදුරා ගැනීමට බේබදු මිතුරන් එල්ල කළ කිනිසි පහරින් පෙදරේරුවා මරුට" යන සිරස්තලය සමගින් දිවයින පුවත්පතේ (ජූනි 30, 2022) පළ වූ වාර්තාවත් සමග දැක්වී තිබූ ලේ වැකි සංවේදී ඡායාරූප ඉහත සඳහන් ආකාරයේ අන්තර්ගතයන්ට නිදසුන් වේ.

1) ඇතැම් පාඨකයෙකුට නැරඹීමට අපහසු විය හැකි ආකාරයේ මෙවැනි ලේ වැකි, සංවේදී දසුන්, අඩු තරමින් කිසිදු බොඳ කිරීමකින් පවා තොරව මෙසේ පළ කිරීම අත්‍යවශ්‍ය වේ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙම සංවේදී අන්තර්ගතයන් රහිතව වුවත් පුවතේ අන්තර්ගතයට හෝ බරපතළ භාවයට හානියක් සිදුවේ යැයි ඔබ සිතන්නේද?

3) මෙම සංවේදී ඡායාරූපයන් මගින්, මෙම පුවත් වාර්තාවන් ඔස්සේ ඉදිරිපත් වන සමස්ත චිත්‍රයට දායකත්වයක් ලැබෙන්නේ යැයි ඔබ සිතන්නේ ද?

ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය නොකරමු. සංවේදී ඡායාරූප පළ නොකරමු!